**කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2022**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 1985 අංක 02 දරන පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 20 වන වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි (105) (2) | අස්ථානගතවී තිබුණු පොත් 808 ක් හා සඟරා 515 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු සිදුකර නොතිබුණි. | මේ සම්බන්ධ විමර්ශනයක් මේ වනවිට සිදුකරමින් පවතින බව. | මුදල් රෙගුලාසි විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 571 | අදාළ කාර්යය නිමවී වර්ෂ 02 ක් ඉක්මවූ එකතු වටිනාකම රු.47,976 ක් වූ තැන්පතු 6 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධව එම ආයතන වෙත 2023.03.31 දින ලිපි මඟින් දැනුම්දෙන ලද බව. | මුදල් රෙගුලාසි විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) 2022 ජනවාරි 03 දිනැති අංක 2022/01 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | වාර්ෂිකව පුස්තකාල පොත් සමීක්ෂණය සිදුකළ යුතු වුවත් 2019 වර්ෂයෙන් පසුව අදාළ සමීක්ෂණ කටයුතු සිදු කර නොතිබුණි. | 2019 වර්ෂයේදී සිදුකරනු ලැබූ පුස්තකාල පොත් සමීක්ෂණය අනුව අස්ථානගතවූ පොත් ගැටළුව සම්බන්ධ විමර්ශනයක් මේ වනවිට සිදුවන හෙයින්, එම ගැටළුව නිරාකරණය වනතෙක්, පුස්තකාල පොත් සමීක්ෂණයක් සිදු නොකරන ලෙස 25 වන පුස්තකාල උපදේශක කමිටු රැස්වීමේදී තීරණය කර ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ)2015 නොවැම්බර් 17 දිනැති අංක 15/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | විභාගය පවත්වා මාස 03 ක් ඇතුළත ප්‍රතිඵල නිකුත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළදී පවත්වන ලද විභාග 03 කට අදාළ විෂයයන් 10 ක ප්‍රතිඵල නිකුත් කිරීම මාස 04 සිට මාස 07 දක්වා කාලයක් ප්‍රමාදවී තිබුණි. | මාස 03 ඉක්මවන ආචාර්යවරුන් වෙත ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අත්සනින් සිහිකැඳවීම් ලිපි යොමුකර විභාග ප්‍රශ්න පත්‍ර කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු සළසා ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,181,409 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.5,471,750 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,653,159 කින් පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට හුවමාරු නොවන ගනුදෙනු මත පුනරාවර්ථන හා ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් රු.12,552,523 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී පශ්චාත් උපාධි පාඨමාලා 07 ක් වෙනුවෙන් සිසුන් 77 දෙනෙකු ලියාපදිංචි කරගෙන තිබුණු අතර ඉකුත් වර්ෂයේදී පශ්චාත් උපාධි පාඨමාලා 05 ක් වෙනුවෙන් ශිෂ්‍ය ලියාපදිංචිය 82 ක්වී තිබුණි. පශ්චාත් උපාධි පාඨමාලා ප්‍රමාණය පෙර වර්ෂයට වඩා 02 ක් වැඩි වුවද පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි සිසුන් ප්‍රමාණය පෙර වර්ෂයට වඩා සිසුන් 05 දෙනෙකුගෙන් අඩුවී තිබුණි. එමෙන්ම සිසුන් 10 කට වැඩියෙන් ලියාපදිංචි වී තිබූ පශ්චාත් උපාධි පාඨමාලා ගණන 04 ක් වූයෙන් ආයතනය පවත්වනු ලබන පශ්චාත් උපාධි පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි. | 2022 අධ්‍යයන වර්ෂය සඳහා සැලකිය යුතු ප්‍රමාණයක අයදුම්පත් ලැබුණද රටෙහි පවතින ආර්ථික අර්බුදය ආරම්භවීමත් සමඟ පාඨමාලා සඳහා ශිෂ්‍ය ලියාපදිංචිය අවම මට්ටමක පැවතුණු බව. | පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ශිෂ්‍ය ආකර්ශණය වැඩිකර ගැනීමට ක්‍රියාකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී උපාධි නොවන පාඨමාලා කිසිවක් සඳහා ශිෂ්‍ය ලියාපදිංචියක් සිදුකර නොතිබුණු අතර අවසන්වරට උපාධි නොවන පාඨමාලා සඳහා සිසුන් ලියාපදිංචි කර ගෙන තිබුණේ 2020 වර්ෂයේදී වූ අතර එය පාඨමාලා 06 ක් සඳහා සිසුන් 220 දෙනෙකු විය. | එවකට පැවති කොවිඩ් වසංගත තත්ත්වය නිසා ප්‍රමාද වූ බව. හඳුන්වාදී ඇති නව පාඨමාලාවන් හතරක් මේ වනවිට අධ්‍යයන කටයුතු සිදුකරගෙන යනු ලබන බව. ඉතිරි පාඨමාලාවන් සඳහාද විෂය නිර්දේශයන් අධ්‍යයන මණ්ඩලයෙන් අනුමත කරගත් පසු ඉදිරියේදී අයදුම්පත් කැඳවීමට නියමිත බව. | උපාධි නොවන පාඨමාලාවන් සඳහාද සිසුන් ලියාපදිංචි කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) | පශ්චාත් උපාධි අපේක්ෂකයින්ගේ නිබන්ධන ඇගයීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම දක්වා ක්‍රියාවලිය සම්බන්ධයෙන් සිදුකළ පරීක්ෂාවේදී, පශ්චාත් උපාධි අපේක්ෂකයින් විසින් ආයතනයට ලබාදී තිබුණු නිබන්ධන පළමු හා දෙවන පරීක්ෂකවරු වෙත භාරදීම සඳහා දින 21 සිට දින 68 දක්වා කාල පරාසයක් ගතවූ අවස්ථා 07 ක්ද, පරීක්ෂකවරු නිබන්ධන පරීක්ෂා කිරීමට දින 60 කට වැඩියෙන් ගතකළ අවස්ථා 14 ක්ද විය. එමෙන්ම පරීක්ෂකවරුන් විසින් නිබන්ධන පරීක්ෂා කිරීමෙන් අනතුරුව වාචික පරීක්ෂණය පැවැත්වීමට දින 60 කට වැඩියෙන් ගතකළ අවස්ථා 03 ක්ද පැවතුණි . | උපාධි නිබන්ධන භාරදුන් පසු අධ්‍යයන මණ්ඩලය මඟින් පරීක්ෂකවරුන් පත් කිරීමට සිදුවේ. එමෙන්ම ඇතැම් අවස්ථාවලදී පත්කරනු ලබන පරීක්ෂකවරුන් උපාධි නිබන්ධනය පරීක්ෂා කිරීම ප්‍රතික්ෂේප කළ විට නැවත පරීක්ෂකවරයෙක් පත්කිරීම සඳහා ඊළඟ අධ්‍යයන මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතුවේ. එබඳු තත්ත්වයන් මෙම ප්‍රමාදයට හේතු වූ බව. | නිරීක්ෂකවරුන් විසින් නිබන්ධන පරීක්ෂා කිරීමට ගතකරන කාලය අවම කිරීමට සහ වාචික පරීක්ෂණ කඩිනමින් පැවැත්වීමට අවශ්‍ය පියවර ගත යුතුය. |